තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

09 ශ්‍රේණිය

කාර්ය පත්‍රිකා සංග්‍රහය

කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

පරිගණක සහ පර්යන්ත උපාංග මිලදී ගැනීම සඳහා පිරිවිතර සැකසීම. - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී **පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර**

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පහත පරිගණක අතරින් නිශ්චිත ස්ථානයක තබා භාවිතා කරන පරිගණක වර්ගයක් නොවන්නේ,

I. සේවාදායක පරිගණක II. වැඩහල් පරිගණක III. මේස පරිගණක IV. උකුල් පරිගණක

02. පරිගණකයේ දත්ත හා වැඩසටහන් ස්ථිර ව තැන්පත් කිරීමට යොදා ගනු ලබන්නේ,

I. ආදාන උපාංග II. ප්‍රතිදාන උපාංග III. ආචයන උපාංග IV. ප්‍රධාන මතකය

03. ආදාන උපාංගයක් සඳහා උදාහරණයක් වන්නේ,

I. සංදර්ශකය II. සැණෙලි මතකය III. මුද්‍රණ යන්ත්‍රය IV. මයික්‍රොෆෝනය

04. පරිගණකයේ මොළය ලෙස හඳුන්වන්නේ,

I. ප්‍රධාන මතකය II. දෘඪ තැටිය III. මධ්‍ය සැකසුම් ඒකකය IV. ස්පර්ශ තිරය

05. සකසනයේ වේගය මනිනු ලබන ඒකකය වන්නේ,

I. MB II. MHZ III. GB IV. TB

06. Quad Core සකසන තුළ ඇති CPU ප්‍රමාණය වන්නේ,

I. 2 II. 3 III. 4 IV. 5

07. ශබ්දපත තුළ ඇති ලා නිල් (Line in) කෙවෙනිය යොදා ගනු ලබන්නේ ,

I. පරිගණකයට නාදකය සවි කිරීම.

II. පරිගණකයට හිස් බනුව සවි කිරීම.

III. පරිගණකයට මයික්‍රොෆෝනය සවි කිරීම.

IV. පරිගණකයට බාහිර උපාංගයක් හරහා ශබ්ද ලබා දීම.

08. USB කෙවෙනියට සම්බන්ධ කළ නොහැකි පර්යන්ත උපාංගයක් වන්නේ,

I. මුද්‍රණ යන්ත්‍රය II. වෙබ් කැමරාව III. තීරු කේත කියවනය IV. සංදර්ශකය

09. පරිගණක ජාල ගත කිරීම සඳහා භාවිතා කරන කෙවෙනිය වන්නේ,

I. PS/2 II. USB III. RJ 45 IV. VGA

10. පරිගණකයක් මිලදී ගැනීමේ දී සලකා බැලිය යුතු තාක්ෂණික පිරිවිතරයක් නොවන්නේ,

I. වගකීම II. මතක ධාරිතාව III. සකසනයේ වේගය IV. තිරයේ ප්‍රමාණය

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහත වගුව සම්පූර්ණ කරන්න.

පුද්ගල නාමය	කාර්යය
	පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය කිරීම.
ජාල පරිපාලක	
	තොරතුරු පද්ධති සැලසුම් කිරීම.
වෙබ් සංවර්ධක	

02. පරිශීලක අවශ්‍යතා සඳහා උදාහරණ 04 ක් ලියන්න.

03. හිස්තැන් පුරවන්න.



04. පරිගණකයක් මිලදී ගැනීමේ දී සලකා බැලිය යුතු තාක්ෂණික නොවන කරුණු 04 ක් ලියන්න.

05. මධ්‍ය සැකසුම් ඒකකය ප්‍රමාණය අනුව වර්ග කළ හැකි ආකාර කීයද? ඒ මොනවාද ?

විද්‍යුත් පැතුරුම් පත් - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී　　　　පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. වැඩපතක ඉංග්‍රිසි හෝඩියේ අක්ෂර වලින් පෙන්නුම් කරන්නේ,

I. පේළි　　II. තීරු　　III. කෝෂ　　IV. කෝෂ පරාසය

02. තීරුවක් සහ පේළියක් එකතු වන ස්ථානය .... නමින් හැඳින්වේ.

I. කෝෂ පරාසය　　II. කෝෂය　　III. නාම කොටුව　　IV. සූත්‍ර තීරය

03. කෝෂ හැඩසවි කිරීමේ මෙවලමක් නොවන්නේ,

I. **B**　　II. <u>U</u>　　III. 　　IV. *I*

04. කෝෂ එකෙල්ල කිරීම සහ ස්ථාන ගත කිරීමේ මෙවලමක් වන්නේ,

I. 　　II. *I*　　III. <u>U</u>　　IV. **B**

05. කෝෂයේ ඇති දත්තය මුදල්මය අගයක් බවට පත් කිරීමට යොදා ගන්නා මෙවලම හඳුන්වන්නේ,

I. Number　　II. Percentage　　III. Accounting　　IV. Currency

➢ පහත වැඩපත යොදා ගෙන 6, 7, 8, 9 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

	A	B	C	D	E	F
1	නම	විෂය			මුළු ලකුණු	සාමාන්‍යය
2		ගණිතය	විද්‍යාව	ඉංග්‍රීසි		
3	A	85	68	72		
4	B	96	88	75		
5	C	78	97	86		
6	වැඩිම ලකුණු					
7	අඩුම ලකුණු					
8						

06. A ගේ මුළු ලකුණු සෙවීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය වන්නේ,

I. = Sum (B3 : D3)　　II. = Sum (A3 : D3)

III. Sum (A3 : D3)　　IV. Sum (B3 : D3)

07. A ගේ වැඩිම ලකුණු සෙවීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය වන්නේ ,

I. = Min (B2 : B5)　　II. = Max (B2 : B5)

III. = Min (B3 : B5)　　IV. = Max (B3 : B5)

08. B ගේ සාමාන්‍ය ලකුණු ලබා ගැනීමට අදාළ සූත්‍රය භාවිතා කළ යුතු කෝෂ නාමය වන්නේ,

I. C5 II. F4 III. E3 IV. F3

09. C ගේ අවම ලකුණු සෙවීම සඳහා .... සූත්‍රය භාවිතා වේ.

I. Min (D3 : D5) II. Max (D3 : D5)

III. = Min (D3 : D5) IV. = Max (D3 : D5)

10.  මෙහි දක්වා ඇති ප්‍රස්තාර වර්ගය වන්නේ,

I. ස්තම්භ ප්‍රස්තාර (Column Chart) II. වට ප්‍රස්තාර (Pie Chart)

III. රේඛා ප්‍රස්තාර (Line Chart) IV. තීරු/දඬු ප්‍රස්තාර (Bar Chart)

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පැතුරුම්පත් යන්න හඳුන්වන්න.

02. පැතුරුම්පත් මෘදුකාංගයේ කාර්යයන් 03 ක් සඳහන් කරන්න.

03. පහත වැඩපතෙහි A, B, C, D ලෙස හඳුන්වා දී ඇති කොටස් නම් කරන්න.



04. පහත ගණනය කිරීම් සඳහා යොදා ගන්නා ශ්‍රිතයන් ලියා දක්වන්න.

I. කෝෂ පරාසයක එකතුව සෙවීම

II. කෝෂ පරාසයක සාමාන්‍යය සෙවීම

III. කෝෂ පරාසයක වැඩිම අගය සෙවීම

IV. කෝෂ පරාසයක වැඩිම අගය සෙවීම

05. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයේ දී භාවිතයට ගන්නා ප්‍රස්තාර වර්ග 04 ක් ලියන්න.

ක්‍රමලේඛ ගොඩනැගීම - 9 ශ්‍රේණිය

සැකසුම - බී.එම්.ජී. අයේෂිකා කුමුදුමාලි පාසල - අම්/ උහන ජාතික පාසල

- පෙළ පොතේ පස්වන ඒකකය ඇසුරෙන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. ගැටළු විසඳීමේදී ගැටළුව විශ්ලේෂණය කළ යුතුය. එහිදී හඳුනාගත යුතු අංග ඇතුලත් පිළිතුර ලෙස සැලකිය නොහැක්කේ,

1. ආදානය, ඇල්ගොරිතම, ප්‍රතිදානය
2. ප්‍රතිදානය, ක්‍රියාවලිය, ඇල්ගොරිතම
3. ආදානය, ක්‍රියාවලිය, ප්‍රතිදානය
4. ක්‍රියාවලිය, ආදානය, ඇල්ගොරිතම

2. වර්ගඵලය සෙවීමට අදාළ ගැටළුවෙහි ක්‍රියාවලිය වන්නේ,

1. වර්ගඵලය 2. දිග 3. දිග x පළල 4. දිග, පළල

3. ගැටළුවකට අදාළ ප්‍රතිඵල හඳුන්වනු ලබන්නේ,

1. ආදානය 2. ප්‍රතිදානය 3. ක්‍රමය 4. ඇල්ගොරිතම

4. විදුලිය සහිත දිනයක් නම් සිසුන්ට ICT විෂය සඳහා පරිගණක විද්‍යාගාරයට පැමිණෙන ලෙසද නැතිනම් ගුරුතුමා පන්ති කාමරයට පැමිණෙන බවද දන්වා ඇත. එය අයත් වන පාලන ව්‍යුහය කුමක්ද?

1. තේරීම 2. පුනර්කරණ 3. සරල තේරීම 4. අනුක්‍රමය

5. ▭ මෙම ගැලීම් සටහන් සංකේතය භාවිතා කරනු ලබන්නේ කුමක් දැක්වීම සඳහා ද?

1. ආරම්භය 2. ආදානය 3. ක්‍රියාවලිය 4. වරණය

6. සත්‍ය ප්‍රකාශය තෝරන්න

a. Scratch යනු දෘඩාංගයකි.
b. මෙමගින් සජීවීකරණ හා ක්‍රීඩා නිර්මාණය කළ හැකිය.
c. මෙය අන්තර්ජාලය හරහා නොමිලේ බාගත (download) කළ හැකිය.

1. a, b පමණි 2. a, c පමණි 3. b, c පමණි 4. a ,b,c සියල්ලම

- පහත රූප සටහන භාවිතයෙන් ප්‍රශ්න අංක 7 සිට අංක 9 දක්වා පිළිතුරු සපයන්න.



7. මෙහි අන්තර්ගත පාලන ව්‍යුහය වන්නේ කුමක්ද?

1. අනුක්‍රමය
2. තේරීම
3. සරල තේරීම
4. පුනර්කරණය

8. මෙහි ප්‍රතිදානය වන්නේ ,

1. 0,1,2,3,4
2. 1,2,3,4,5
3. 5,10,15,20,25
4. 5,6,7,8,9

9. මෙහි සංඛ්‍යාව = 1 යනු මින් කවරක්ද?

1. ආදානය
2. ක්‍රියාවලිය
3. ප්‍රතිදානය
4. වරණය

10. අගයන් ඕනෑම ප්‍රමාණයක් තනි නාමයකින් තැන්පත් කිරීමට හැකි දත්ත ව්‍යුහය හඳුන්වන නාමය වන්නේ,

1. අරාව 2. විචල්‍ය 3. සංකේතය 4. නාමය

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01.

i) ඇල්ගොරිතමයක් යනු කුමක්දැයි හඳුන්වා ඇල්ගොරිතම නිරූපණය කිරීමට අදාළ පාලන ව්‍යුහ තුන ලියා දක්වන්න.

ii) පන්ති කාමරයේ පරිමිතිය සෙවීම ට අදාළ ආදාන ප්‍රතිදාන ක්‍රියාවලිය ලියා දක්වන්න.

iii) පන්ති කාමරයේ පරිමිතිය සෙවීම සඳහා ඇල්ගොරිතමය ගැලීම් සටහන් මගින් දක්වන්න.

02. යම් කොන්දේසියක් තෘප්ත වීම හෝ නොවීම අනුව ක්‍රියාත්මක වීම හෝ නොවීම තීරණය වන අවස්ථා වරණය හෙවත් තේරීම පාලන ව්‍යුහයට අයත් වේ.

i) තේරීමට අදාළ උදාහරණ තුනක් ලියා දක්වන්න.

ii) සංඛ්‍යාවක් ඇතුළත් කළ විට එම සංඛ්‍යාව ඔත්තේද ඉරට්ටේද යන්න ප්‍රදර්ශනය කිරීමට අදාළ ගැලීම් සටහන අඳින්න.

03. තේරීම් ආකාර දෙකකි .එනම් සරල තේරීම හා බහු කොන්දේසි සහිත තේරීමයි .

i) මෙම ආකාර දෙක අතර වෙනස ලියා දක්වන්න

ii) පාසලක ගැමුණු පැරකුම් හා විජය ලෙස නිවාස තුනකි. සිසුන් නිවාස වලට වෙන් කිරීමේදී ඇතුලත්වීමේ අංකය තුනෙන් බෙදා ඉතිරිය අනුව නිවාස වලට වෙන් කරයි. ඉතිරිය 0 නම් ගැමුණු, ඉතිරිය 1 නම් පැරකුම් ද ඉතිරිය 2 නම් විජය ලෙසද වෙන්කරයි . මෙම ක්‍රියාවලියට අදාළ ගැලීම් සටහන ඇඳ දක්වන්න.

04.

i) පුනර්කරණ ක්‍රියාවලිය යනු කුමක්ද?

ii) ඒ සඳහා උදාහරණ තුනක් සපයන්න.

iii) 1 සිට 10 දක්වා සංඛ්‍යා ප්‍රතිදානය කිරීමට අදාළ ගැලීම් සටහන ඇඳ දක්වන්න.

05.

i) පන්තියේ නාමලේඛනයේ ලකුණු කිරීමේදී සිසුවා පැමිණ සිටී නම් 1 ලෙසද නැතිනම් 0 ලෙසද සටහන් කරයි මෙයට අදාළ අදාල ගැලීම් සටහන ඇඳ දක්වන්න

ii) ICT ලකුණු 35 හෝ 35 ට වැඩි නම් සමත් ලෙසද නැතිනම් අසමත් ලෙසද ප්‍රදර්ශණය කරනු ලබන ක්‍රමලේඛයට අදාල Scratch වැඩසටහනෙහි කාණ්ඩ පහත දැක්වේ. ඒවා නිවැරදි අනුපිළිවෙලට පෙළගස්වන්න.

A


B


C

D


E


F


G

H


ක්ෂුද්‍ර පාලක භාවිතය - 9 ශ්‍රේණිය

සැකසුම - බී.එම්.ජී. අයේෂිකා කුමුදුමාලි   පාසල - අම්/ උහන ජාතික පාසල

• පෙළ පොතේ හයවන ඒකකය ඇසුරෙන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. පාරිසරික වෙනස්වීම් හඳුනාගනිමින් ඊට අනුරූපව ක්‍රියා කිරීමට භාවිතා කරනු ලබන උපාංගය වන්නේ,

1. සංවේදක   2. ක්ෂුද්‍ර පාලක   3. CPU   4. RAM

2. සංවේදක (sensor) මඟින් සිදු කරනු ලබන කාර්ය වන්නේ,

1. ආදානය   2. ප්‍රතිදානය   3. විශ්ලේෂණය   4. පාලනය

3. බහුලව භාවිතා වන ක්ෂුද්‍ර පාලක (microcontroller) මෙවලම් කට්ටලයක් නොවන්නේ ,

1. Micro:bit   2. Arduino   3. LED   4. Rasberry pi

4. සංවේදක හා ක්ෂුද්‍ර පාලක භාවිතාවන උපාංගයක් වන්නේ

1. රෙදි සෝදන යන්ත්‍ර   2. ගෑස් උදුන   3. විදුලි බල්බය   4. ස්විචය

5. www.microbit.co.uk වෙබ් අඩවියෙන් ලබාගත හැකි මෙවලම් කට්ටලය වන්නේ?

1. Rasberry pi   2. Arduino   3. Word   4. Microbit

6. ක්ෂුද්‍ර පාලක සම්බන්ධව පහත ප්‍රකාශ සලකන්න.

a. මෙය චිපයක් (chip)ලෙස පවතී.
b. මෙයට අවශ්‍ය පරිදි උපදෙස් ලබා දිය හැකිය.
c. මෙමගින් කිසිදු ප්‍රතිදානයක් ලබා ගත නොහැක.

මින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ තෝරන්න

1. a පමණි   2. a, b පමණි   3. a, c පමණි   4. a ,b,c සියල්ලම

7. මොඩියුලය පරිගණකයට සම්බන්ධ කිරීමට භාවිතා කරනු ලබන කේබලය වන්නේ,

1. ක්ෂුද්‍ර USB   2. RJ45   3. HDMI   4. VGA

8. පහත රූපසටහනෙන් දක්වා ඇති Arduino පුවරුව වන්නේ,



1. Arduino Uno පුවරුව
2. Arduino Mega පුවරුව
3. Arduino Nano පුවරුව
4. Arduino Micro පුවරුව

9. පහත රූප සටහනෙන් දක්වා ඇත්තේ,



1. Passive Infrared Sensor (PIR) සංවේදකය
2. ආලෝක විමෝචක ඩයෝඩ (Light Emitting Diode - LED)
3. අති ධ්වනි තරංග (Ultrasonic waves) සංවේදකය
4. Bread board

10. භාවිතා කර කේත ගතකිරීම් සිදු කිරීමේදී ඒ සඳහා කාණ්ඩ (block) භාවිතා කළ හැක. එවැනි කාණ්ඩ කිහිපයක් පහත දක්වා ඇත.ඉන් සංඛ්‍යාවක් දර්ශණය කර ගැනීමට භාවිතා කළ හැකි කාණ්ඩය වන්නේ,

1.


2.


3.


4.


- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01.

i) ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන විදුලි ලාම්පු පද්ධතියක් නගරයේ ස්ථාපනය කර ඇත. මෙහි ආලෝක සංවේදකය මගින් දත්ත රැස් කරන අතර ක්ෂුද්‍ර පාලකය මගින් බල්බය දැල්වීම දැල්වීම හෝ නිවීම සිදුකරයි. මෙහි ආදානය ක්‍රියාවලිය හා ප්‍රතිදානය සිදු කරනු ලබන උපාංග වෙන වෙනම ලියා දක්වන්න.

ii) ක්ෂුද්‍ර පාලකයක අන්තර්ගත ප්‍රධාන කොටස් හතර මොනවාද?

iii) එම කොටස්වල කාර්යයන් වෙන වෙනම කෙටියෙන් ලියා දක්වන්න.

02.

i) තනි පුවරු පරිගණකයක් (Single Board Computer - SBC) යනු කුමක්ද? ඒ සඳහා සඳහා උදාහරණයක් සපයන්න.

ii) තනි චිපයේ පරිගණකයක් (Single Chip Computer - SCC) යනු කුමක්ද? ඒ සඳහා උදාහරණයක් සපයන්න.

iii) සංවේදක හා ක්ෂුද්‍ර පාලක භාවිතා කරනු ලබන උපාංග පහක් නම් කරන්න.

03. මෙහි දැක්වෙන්නේ ක්ෂුද්‍ර පාලක මෙවලම් කට්ටලය කට්ටලයක ඉදිරිපස පෙනුමක් හා පිටුපස පෙනුමකි. එම කොටස් හඳුනාගෙන ඒවා නම් කරන්න.



බ්ලූටූත් සුහුරු ඇන්ටනාව , ක්ෂුද්‍ර USB කෙවෙනිය , ක්‍රමලේඛනය කළ හැකි බොත්තම්, ක්‍රමලේඛනය කළ හැකි LED , ක්ෂුද්‍ර පාලකය , ත්වරණ මීටරය සහ මාලිමාව, භූගත කෙවෙනිය , සංඛ්‍යාංක හා ද්විසම තුඩු , විදුලි සම්බන්ධක කෙවෙනිය , කෝෂ සම්බන්ධකය

04. Arduino යනු Atmel සමාගම නිර්මාණය කරන ලද ක්ෂුද්‍ර පාලකයකි. එහි කොටස් නම් කරන්න



සංඛ්‍යාංක තුඩු (Digital Pins) , ප්‍රතිසම තුඩු (Analog Pins) , විදුලි නියාමකය (Power Regilulator) , ATMEGA328p , DC විදුලි සැපයුම (DC Power) , Mini USB

i) Ardiuno පුවරුවෙහි පහත කොටස් වලින් ඉටුකරනු ලබන කාර්යයන් මොනවාද?

a. විදුලි නියාමකය

b. DC විදුලි සැපයුම

c. ප්‍රතිසම තුඩු

d. සංඛ්‍යාංක තුඩු

05. පහත දක්වා ඇත්තේ microbit මගින් නිර්මාණය කර ඇති වැඩසටහන් වලදී භාවිතා වන කාණ්ඩ (Blocks) කිහිපයකි. මෙවායේ ක්‍රියාකාරිත්වයන් ලියා දක්වන්න.

a.


b.


c.


d.


e.


f.


g.


h.


පරිගණක ජාලකරණය - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී

පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පරිගණක ජාලකරණයේ අවාසියකි.

I. දත්ත හුවමාරුව

II. විද්‍යුත් තැපෑල

III. සම්පත් පොදුවේ භාවිතය

IV. පරිගණක වෛරස්

02. රැහැන් සහිත ජාලකරණයේ දී භාවිතා වන මාධ්‍යයක් වන්නේ,

I. අධෝරක්ත කිරණ II. වයි - ෆයි III. ප්‍රකාශ තන්තු IV. රේඩියෝ තරංග

- පහත රූප සටහන භාවිතයෙන් 3, 4, 5 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



03. ඉහත රූප සටහනේ A ලෙස නම් කර ඇත්තේ,

I. සේවාදායකය II. පරිගණකය 3 III. ස්විචය IV. මුද්‍රණ යන්ත්‍රය

04. B හි සඳහන් උපකරණය වන්නේ,

I. සේවාදායකය II. පරිගණකය 3 III. ස්විචය IV. මුද්‍රණ යන්ත්‍රය

05. C ලෙස නම් කර ඇත්තේ ,

I. සේවාදායකය II. මුද්‍රණ යන්ත්‍රය III. පරිගණකය 3 IV. ස්විචය

06. පරිගණක ජාල ගත කිරීමේ මූලික අරමුණක් නොවන්නේ,

I. දත්ත සන්නිවේදනය කිරීම.

II. මෘදුකාංග හවුලේ භාවිතය

III. දෘඪාංග හවුලේ භාවිතය

IV. දත්ත වල ආරක්ෂාව

07. පරිගණක ජාලකරණයේ දී හවුලේ භාවිතා කළ හැකි පරිගණක උපාංගයක් වන්නේ ,

I. සංදර්ශකය II. මූසිකය III. යතුරු පුවරුව IV. සුපරීක්ෂණය

08. එක් පරිගණක ජාලයක් වෙනත් පරිගණක ජාලයකට හෝ අන්තර්ජාලයට සම්බන්ධ කිරීම සඳහා .... යොදා ගැනේ.

I. සේවාදායකය II. මං හසුරුව III. සේවාලාභී පරිගණක IV. අතුරු මුහුණත්

09. සම්පත් හවුලේ භාවිතය සඳහා උදාහරණයක් නොවන්නේ,

I. පණිවිඩ හුවමාරුව II. දෘඪාංග භාවිතය III. මෘදුකාංග භාවිතය IV. දත්ත හුවමාරුව

10. පරිගණක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර සබඳතාවක් ගොඩ නැගීම සඳහා මැදිහත්කරු ලෙස ක්‍රියා කරයි.

I. සේවාදායකය II. ජාලකරණ කාඩ්පත III. RJ 45 සම්බන්ධකය IV. ස්විචය

➤ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පරිගණක ජාලකරණය යනු කුමක්ද?

02. ජාලකරණයේ වාසි 03 ක් ලියන්න.

03. පහත වගුව සම්පූර්ණ කරන්න.

පරිගණක ජාල සම්බන්ධ කිරීමේ දී යොදා ගනු ලබන මාධ්‍ය	උදාහරණ
1.	1. 2.
1.	1. 2.

04. පරිගණක ජාල ගත කිරීමට අවශ්‍ය මූලික උපාංග 03 ක් ලියන්න.

05. සේවාදායක හා සේවාලාභී පරිගණක හඳුන්වන්න.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ සමාජය - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී **පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර**

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. e - වාණිජ සේවාවක් වන්නේ,

I. මාර්ගගත සාප්පු සවාරිය II. බිල්පත් ගෙවීමේ සේවා

III. රෝග හඳුනා ගැනීමේ උපකරණ IV. අන්තර්ජාලය මඟින් තොරතුරු සොයා ගැනීම.

02. නව තාක්ෂණික උපාංග සහ සම්පත් භාවිතය සඳහා පහසුකම් තිබීම / නොතිබීම නිසා සමාජයේ ඇති වී ඇති බෙදීම .... වේ.

I. e – ඉගෙනුම II. 3R සංකල්පය III. විද්‍යුත් අපද්‍රව්‍ය IV. අංකිත බෙදීම

03. විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සඳහා .... සංකල්පය යොදා ගැනේ.

I. e – ඉගෙනුම II. e – රාජ්‍ය III. 3R IV. e – සෞඛ්‍ය

04. පරිගණක උපකරණ හැකි සෑම විටම අළුත් වැඩියා කර නැවත භාවිතා කිරීම,

I. Reduce වේ. II. Reuse වේ. III. Recycle වේ. IV. Reproduction වේ.

05. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ස්නායු ආබාධ ඇතිවීම, අක්මාවට හානි වීම .... ලෙස හැඳින්වේ.

I. සෙලනියම් II. බෙරිලියම් III. මර්කරි IV. බේරියම්

06. " ආසනික් " රෝග තත්වය යනුවෙන් හඳුන්වන්නේ,

I. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ශාරීරික දුර්වලතා ඇතිවීම.

II. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා හෘද හානිය ඇතිවීම.

III. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා පේශි දුර්වලතා ඇතිවීම.

IV. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා පිළිකා ඇතිවීම.

07. පරිගණක මෘදුකාංග නිර්මාණය කරන්නා .... ලෙස හැඳින්වේ.

I. මෘදුකාංග නිර්මාණ ශිල්පී
II. මෘදුකාංග තත්ව සහතික ඉංජිනේරු
III. මෘදුකාංග ඉංජිනේරු
IV. පද්ධති විශ්ලේෂක

08. වැඩසටහන් ක්‍රමලේඛක යනුවෙන් හැඳින්වෙන්නේ,

I. මෘදුකාංග කේත පරීක්ෂා කරන්නා

II. පරිගණක භාෂා භාවිත කරමින් වැඩසටහන් සම්පාදනය කරන්නා

III. වෙබ් අඩවි නිර්මාණය, සංවර්ධනය හා යාවත්කාලීන කරන්නා

IV. පරිගණක ජාල ස්ථාපනය, නඩත්තුව සිදු කරන්නා

09. පරිගණක දෘඩාංග වල ක්‍රියාකාරී කාලය අවසන් වූ විට හෝ එය භාවිතයෙන් ඉවත් කළ විට .... ලෙස සලකනු ලැබේ.

I. 3R ක්‍රමය
II. විද්‍යුත් අපද්‍රව්‍ය
III. e- වාණිජ
IV. අංකිත බෙදීම

10. විනාශකාරී විද්‍යුත් අපද්‍රව්‍යයක් නොවන්නේ,

I. ලේබන්
II. රැහැන්
III. සංයුක්ත තැටි කවර
IV. මව් පුවරුව

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. e- රාජ්‍යයේ සේවාවන් 04 ක් සඳහන් කරන්න.

02. "අංකිත බෙදීම" යන්න හඳුන්වන්න.

03. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා මිනිසාට වැළඳිය හැකි රෝගාබාධ 05 ක් ලියන්න.

04. 3R සංකල්පය හඳුන්වන්න.

05. පරිගණක ආශ්‍රිත රැකියා අවස්ථා 03 ක් ලියන්න.